## 2.19 පැරණි වාසස්ථාන පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

දිනිති විජේසූරිය
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

### ABSTRAT

පැරණි වාසස්ථාන ඕනෑම සමාජයක ශේෂවී ඇති විවිධ අංග අතරින් එත් ප්‍රපංචයක් ලෙස සැලකිය හැකිය. මෙම වාසස්ථාන ආකාස්මිකව පහළ වුවක් නොව ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමානය දක්වා වූ ක්‍රමික විකාශනයක ප්‍රතිඵලයකි. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා සංචාරක එඬේර දිවියෙන් සමුගෙන ශිෂ්ට සම්පන්න ගොවියකු බවට පත්වීමත් සමඟ තම වගා බිම් වාසස්ථාන තනා ස්ථිර පදිංචිකරුවෙකු බවට පත්විය. මෙහිදී බිහි වූ නිවාස කොළ අතු,මැටි වැනි අමු ද්‍රව්‍යසහිත සරල තාක්ෂණයක් යටතේ බිහි වූ නිවාස ය (සෙනෙවිරුවන්, 1998, 21). පසුකාලීනව රට තුළට පැමිණෙන ලද විවිධ සංස්කෘතික ප්‍රවාහයන් මෙම වාසස්ථාන සෘජු ලෙසම බලපෑවේ ය. එහෙයින් සරළ සාම්ප්‍රදායික නිවාස පසුකාලීනව විවිධ යුගවල දී සිදුවූ ඉන්දීය, පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි බලපෑම් හේතුවෙන් පැහැදිළි වෙනස්කම් විවිධ, අංග සහිතව වර්ධනය විය (Lewcock etal, 1998).

උක්ත විපර්යාසයන්ට ලක් වූ වාසස්ථාන ශ්‍රී ලංකාව පුරා අදටත් ශේෂව පවතී. එම වාසස්ථානයන්හි විවිධ බලපෑම්වලට ලක්ව විවිධ ගෘහනිර්මාණ අංග අදටත් ශේෂව පැවතීම විශේෂිතය. ආරුක්කු, විශාල සණකම් ලී යෙදූ දොර ජනෙල්, මැද මිදුල්, කොරිඩෝ, විශාල දිගු ආලින්ද වැනි අංග එයට උදාහරණ ය(Lewcoc etal, 1998). ඇතැම් අංග සමහර කාලවල දී ඉවත්ව ගොස් ඇති බවක් දක්නට ලැබේ. වාසස්ථානයන්හි ඇතුලත පිටත අංගයන්ට අමතරව ක්‍රමවත් ගෘහ අලංකරණ ක්‍රම හා උද්‍යාන අලංකාර විධි ඒ තුළ අන්තර්ගතය. මිනිසා තම සංස්කෘතිකාංග ක්‍රමයෙන් වර්ධනය කර ගැනීමත් සමඟ මෙවැනි ක්‍රමවත් ගෘහනිර්මාණ රටාවක් බිහිව ඇති බව පැහැදිළිය. එම නිසා උක්ත නිවාස පිළිබඳව මානව විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් කරන ලද අධ්‍යයනයක් මෙහි දී ඉදිරිපත් කිරීම මෙම පත්‍රිකාවේ අරමුණයි. ඒ සඳහා මිණුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් පැරණි නිවාස කීපයක් යොදා ගෙන ඇත. එම නිවාස අවම වශයෙන් වසර සීයක් පැරණි විය යුතුය යන සීමාවට යටත් වේ.

ආශ්‍රිත ග්‍රන්ථ

| | | |
|---|---|---|
| Lewcock, Ronald,<br>Sansoni, Babara,<br>Senanayake, Lakee | 1998 | Architecture of an Island Barefoot (PVT)<br>Ananda Kumaraswami Mawatha,<br>Colombo. |
| de Silva, Nimal | 1998 | The SriLankan Tradition for Selter<br>Architect SLIA Colombo |
| සෙනෙවිරත්න මතුගම | 1998 | සිංහලවාස්තු කිරිත්තම, පියසර මුද්‍රණ<br>ප්‍රකාශකයෝ බොරලැස්ගමුව |